ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2018

නාට්‍ය හා රංගකලාව ඉගැන්වීම සඳහා අධ්‍යාපන තාක්ෂණය - ESU3327

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.02.05 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. අධ්‍යාපන තාක්ෂණය යන්න සුදුසු නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කර, නාට්‍ය හා රංගකලා විෂය ඵලදායී ලෙස ඉගැන්වීම සඳහා අධ්‍යාපන තාක්ෂණය භාවිත කිරීමේ වැදගත්කම කරුණු තුනක් (03) ඇසුරින් දක්වන්න.

02. වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ මාර්ගගත ඉගෙනුම් ක්‍රමය වඩා ඉස්මතු වීමට හේතු වූ එහි ඇති විභව්‍යතාවයන් පහක් (05) නම් කරන්න.

03. චර්යාමය අරමුණක ප්‍රධාන ලක්ෂණ පහක් (05) පැහැදිලි කරන්න.

04. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ශිෂ්‍ය කේන්ද්‍රීය එළඹුමක දී ගුරුවරයකු ලෙස ඔබ මුහුණදෙන අභියෝග පහක් (05) නම් කරන්න.

05. "පංති කාමර ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පෙළපොතට වැඩි වටිනාකමක් ලැබේ."

    පෙළපොත භාවිතයේ දී ශිෂ්‍යයාට සහ ගුරුවරයාට ඇති වාසි තුන (03) බැගින් වෙන් වෙන්ව පැහැදිලි කරන්න.

06. "සමාකරණය" ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රමයකි.

    (i) සමාකරණය යන්න පැහැදිලි කරන්න.

    (ii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දි එය භාවිත වන අවස්ථා තුනක් (03) නම් කරන්න.

07. පාඩමක් ඉගෙනීමෙන් අනතුරුව සිසු පුද්ගල චර්යාවේ සිදුවන වෙනස පිළිබඳ බී.එස්.බ්ලූම්ගේ අදහස ඉදිරිපත් කරන්න.

08. "භූමිකා නිරූපණය ප්‍රබල ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමයකි."

නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකු ලෙස මෙම ශිල්පීය ක්‍රමය යොදා ගැනීමේ වාසි පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) බහුමාධ්‍ය යනු කුමක්දැයි හඳුන්වන්න.

(ලකුණු 05)

(ii) නාට්‍ය හා රංගකලාව උගන්වන ගුරුවරයකු ලෙස පාඩමක් සාර්ථකව ඉගැන්වීම සඳහා අර්ථවත්ව බහුමාධ්‍ය යොදාගත හැකි ආකාර පහක් (05) විස්තර කරන්න.

(ලකුණු 05)

(iii) ගුරුවරයකු ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අන්තර්ජාලය භාවිත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

10. (i) ඉගැන්වීමේදී පොදුවේ ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ඉගැන්වීමේ ක්‍රම පහ (05) නම් කරන්න.

(ලකුණු 05)

(ii) බී.එෆ්.ස්කිනර් ඉදිරිපත් කළ ඉගැන්වීම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහක් (05) දක්වන්න.

(ලකුණු 05)

(iii) නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකු ලෙස, පී.එෆ්.ස්කිනර් දැක් වූ ඉගැන්වීම් ක්‍රමය යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

11. (i) "ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ට ක්‍රියාකාරී අත්දැකීම් ලබාදීම අතිශය වැදගත් වේ."

ඉහත ප්‍රකාශය ඩේල්ගේ අත්දැකීම් කේතුව ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) නාට්‍ය හා රංගකලා ගුරුවරයකු ලෙස නිර්මාණශීලී චින්තනය අවදි කරමින් පාඩම සංවර්ධනය සඳහා ඩේල්ගේ අත්දැකීම් කේතුව යොදා ගත හැකි ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) ඉගෙනුම් ආධාරක භාවිත කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට වැදගත් වන ආකාරය කරුණු පහක් (05) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

(ii) නාට්‍ය හා රංගකලා විෂය උගන්වන ගුරුවරයකු ලෙස ද්විතීයික ශ්‍රේණියක සිසුන්ට නාඩගම් ශෛලිය පිළිබඳ පාඩමක් ඉගැන්වීමේ දී,

(a) ඔබ විසින් යොදා ගන්නා ඉගෙනුම් ආධාරක

(b) එම ඉගෙනුම් ආධාරක යොදා ගන්නා ආකාරය

(c) ඒවා ඔබේ ඉගැන්වීම පහසු කළ ආකාරය

පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. ද්විතීයික පාසල් මට්ටමේ ඇති (6-9) ශ්‍රේණිවලින් එක් ශ්‍රේණියකින් නාට්‍ය හා රංගකලා විෂයට අදාළ පාඩමක් තෝරා ගන්න.

(i) ඔබ තෝරාගත් පාඩම ඇසුරින් සිසුන් අත්කර ගැනීමට අපේක්ෂිත නිපුණතා මට්ටම් සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) එහි එක් නිපුණතා මට්ටමකට අදාළව සුවිශේෂී චර්යාමය අරමුණු පහක් (05) දක්වන්න. (ලකුණු 05)

(iii) ඉහත නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගැනීම සඳහා යෝග්‍ය පාඩම් සැලසුමක් සංවර්ධනය කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.